09
පාඩම
नवमः पाठः

# නාම වර නැඟීම - II

## (අකාරාන්ත පුරුෂලිංග कुमार ශබ්දය)

### 9.1 ක්‍රියාකාරකම

අකාරාන්ත පුරුෂලිංග **कुमार** ශබ්දය වාචෝද්ගත කරමු.

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | कुमारः | कुमारौ | कुमाराः |
| सम्बोधन | हे कुमार | हे कुमारौ | हे कुमाराः |
| द्वितीया | कुमारम् | कुमारौ | कुमारान् |
| तृतीया | कुमारेण | कुमाराभ्याम् | कुमारैः |
| चतुर्थी | कुमाराय | कुमाराभ्याम् | कुमारेभ्यः |
| पञ्चमी | कुमारात् | कुमाराभ्याम् | कुमारेभ्यः |
| षष्ठी | कुमारस्य | कुमारयोः | कुमाराणाम् |
| सप्तमी | कुमारे | कुमारयोः | कुमारेषु |

### 9.2 ක්‍රියාකාරකම

(कुमार) ශබ්දයට සමාන ශබ්ද වාචෝද්ගත කර වරනඟමු.

| | | | |
|---|---|---|---|
| पालक | පාලකයා | नाविक | නැවියා |
| कपोत | පරවියා | कुक्कुट | කුකුළා |
| कृषीवल | ගොවියා | शृगाल | සිවලා |

| | | | |
|---|---|---|---|
| जनक | පියා | नायक | නායකයා |
| नर | මිනිසා | भट | භටයා |
| सिंह | සිංහයා | चटक | ගේකුරුල්ලා |
| बिडाल | බළලා | सारमेय | බල්ලා |
| वृद्ध | මහල්ලා | उपासक | උපාසකයා |
| मार्ग | මාර්ගය | छात्र | ශිෂ්‍යයා |

## 9.1 අභ්‍යාසය

පහත සඳහන් නාමපදවල විභක්තිය, වචනය සහ තේරුම ලියමු.

| | විභක්තිය | වචනය | තේරුම |
|---|---|---|---|
| උදා:- काकाः | ප්‍රථමා | බහුවචන | කපුටෝ |
| १ बालकः | .............. | .............. | .............. |
| २ बालकयोः | .............. | .............. | .............. |
| ३ बालकेन | .............. | .............. | .............. |
| ४ बालकैः | .............. | .............. | .............. |
| ५ वृक्षे | .............. | .............. | .............. |
| ६ कुमारेषु | .............. | .............. | .............. |
| ७ शुकानाम् | ............... | .............. | .............. |
| ८ देवाभ्याम् | .............. | .............. | .............. |
| ९ गजम् | .............. | .............. | .............. |
| १० अजे | .............. | .............. | .............. |

| | | | |
|---|---|---|---|
| ११ उपासकेन | ............... | ............... | ............... |
| १२ काकयोः | ............... | ............... | ............... |
| १३ शुनकाय | ............... | ............... | ............... |
| १४ काकेषु | ............... | ............... | ............... |
| १५ सारमेयम् | ............... | ............... | ............... |
| १६ काकाभ्याम् | ............... | ............... | ............... |
| १७ मूर्खात् | ............... | ............... | ............... |
| १८ मूर्खाः | ............... | ............... | ............... |
| १९ दासानाम् | ............... | ............... | ............... |
| २० चटकम् | ............... | ............... | ............... |

## පහත සඳහන් වාක්‍ය උගනිමු.

❖ तत् ශබ්දයේ පුල්ලිංග ප්‍රථමා විභක්ති ඒකවචන, ද්විවචන, බහුවචන නාමපද වාක්‍යයක තනි ව යෙදුණු විට सः හෙතෙම, तौ ඔවුහු දෙදෙන, ते ඔවුහු යනුවෙන් අර්ථ ප්‍රකාශ වෙයි.

सः गच्छति। හෙතෙම යයි.

तौ पठतः। ඔවුහු දෙදෙනා පාඩම් කරත්.

ते क्रीडन्ति। ඔවුහු ක්‍රීඩා කරති.

❖ නාමපදයට විශේෂණ ව **सः, तौ, ते** යෙදුණු විට එම පදවල අර්ථය පොදුවේ ''ඒ'' යනුවෙන් ප්‍රකාශ වෙයි.

| | |
|---|---|
| सः पुरुषः गच्छति । | ඒ මිනිසා යයි. |
| तौ छात्रौ पठतः । | ඒ ශිෂ්‍යයෝ දෙදෙනා පාඩම් කරත්. |
| ते बालकाः क्रीडन्ति । | ඒ ළමයි ක්‍රීඩා කරති. |

## 9.2 අභ්‍යාසය

**පහත සඳහන් සංස්කෘත වාක්‍ය සිංහලයට නගන්න.**

| | |
|---|---|
| १ सः तिष्ठति । | ७ सः बालकः हसति । |
| २ सः खादति । | ८ सः वानरः खादति । |
| ३ तौ पिबतः । | ९ तौ अश्वौ धावतः । |
| ४ तौ वहतः । | १० तौ शुकौ कूजतः । |
| ५ ते यच्छन्ति । | ११ ते सूदाः पचन्ति । |
| ६ ते क्रीडन्ति । | १२ ते बालकाः क्रीडन्ति । |

## 9.3 අභ්‍යාසය

**පහත සඳහන් සිංහල වාක්‍ය සංස්කෘතයට නගන්න.**

1. ළමයා සිනාසෙයි.
2. ඒ ළමයා දුවයි.
3. හෙතෙම පාඩම් කරයි.

4. ඒ පුරුෂයෝ දෙදෙන ගෙනයත්.

5. ඔවුහු දෙදෙන පාඩම් කරත්.

6. කුමාරවරු පාඩම් කරති.

7.ගිරවා පියාඹයි.

8. දෙවියා සිටියි.

9. දෙවිවරු දෙදෙන සිටිත්.

10. ඒ දෙවිවරු සිටිති.

11. එළුවා කයි.

12. එළුවෝ දෙදෙන කත්.

13. ඒ එළුවෝ කති.

14. ඒ වඳුරා නගියි.

15. වඳුරෝ දෙදෙන නගිත්.

16. වඳුරෝ නගිති.

17. ඒ සොරු දෙදෙන යත්.

18. යෝධයෝ උසුලති.

19. ඒ ගොන්නු කති.

20. ඔවුහු පිසත්.